www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ෆැසිස්ට්වාදය හා මහ යුදෙව් සංහාරය

## ඩැනියෙල් ගෝල්ඩ්හාගන්ගේ *Hitler's Willing Executioners* (හිට්ලර්ගේ ආසක්ත අලුගෝසුවෝ) කෘතිය පිලිබඳ විවේචනාත්මක විචාරයක්

**Fascism & the Holocaust**
**A critical review of Daniel Goldhagen's Hitler's Willing Executioners**

*පහත පලවන්නේ එක්සත් ජනපදයේ සමාජවාදී සමානතා පක්ෂයේ ජාතික ලේකම් ඩේවිඩ් නෝර්ත් 1997 අප්‍රේල් 17 දා නැගෙනහිර ලැන්සිග් හි මිචිගන් රාජ්‍ය විශ්වවිද්‍යාලයේ දී පැවැත් වූ දේශනයකි. 1997 මැයි 30 කම්කරු මාවත පුවත්පතේ පලවූ ලිපිය කොටස් හතරකින් මෙහි පලකරමු.*

### තුන්වන කොටස

### ජර්මනියේ දේශපාලන යුදෙව්-විරෝධය යලි පන ගැසීම

පලමු වන ලෝක යුද්ධයෙන් පසු ජර්මනියේ විප්ලවය පුපුරා ගොස් හෝහෙන්සොලර්න් රාජාන්ඩුව බිඳ වැටීමත් සමඟ යුදෙව් විරෝධය දේශපාලන අවියක් ලෙස යොදා ගැනීම යලිත් වරක් බරපතල සාධකයක් බවට පත් විය. නාසි ප්‍රචාරයේ දී ප්‍රධාන ක්‍රියා කලාපයක් ඉටු කල යුදෙව් විරෝධයේ බලය, සුලු ධනේශ්වරයේ අපේක්ෂාභංගයට ද කම්කරු පන්තියේ දේශපාලන නොමඟ යාමට ද ඍජුව අනුපාතික විය. ජර්මනිය යුද්ධය පරාජය වීමට පසුව එලඹි සිද්ධීන් නිසා සුලු ධනේශ්වරය කම්පාවට පත්වී තිබුනි. ගෙල මිරිකනු ලැබූ විප්ලවයක් මත ගොඩනැගුනු වයිමාර් සමූහාන්ඩුව අර්බුදයෙන් අර්බුදයට ගමන් කලේ ය.

ට්‍රොට්ස්කි මෙසේ ලිවීය: "පශ්චාත් යුධ කාලීන වියවුල හස්ත කර්මාන්තකරුවන්ට ද තොරොම්බල්කරුවන්ට ද සිවිල් නිලධාරීන්ට ද කම්කරුවන්ට තරම් ම නො අඩුව පහර එල්ල කලේ ය......... යුද්ධය, පරාජය, වන්දි, උද්දමනය, රූර් පෙදෙස ප්‍රන්සය විසින් අල්ලා ගැනීම, අර්බුදය, දරිද්‍රතාව, උමතුව යන මේ සියල්ල අලලාගත් වාතාවරනය තුල සුලු ධනේශ්වරය මෙන්ම රැවටූ සියලු පක්ෂයන්ට එරෙහිව නැගී සිටියේ ය. කවර කලෙකවත් බංකොලොත් බවෙන් ගොඩ නො ආ කුඩා දේපල හිමියන් ද, සරසවි ගිය එහෙත් රැකියා හෝ සේවා දායකයන් නො ලත් ඔවුන්ගේ පුත්‍රයන්ගේ ද දෑවැද්ද හෝ මනාලයන් නොලත් ඔවුන්ගේ දූවරුන්ගේ ද තියුනු මැසිවිලි වලින් ඉල්ලා සිටිනු ලැබුවේ ස්ථාවරත්වය හා යකඩ හස්තයකි.

තමන් කම්කරු පන්තිය තුලට ඇද වැටෙතැයි නිරතුරුව බියට පත්ව සිටි මෙම ස්ථරයේ වියරු බව, කාන්සාව හා වේදනා වලට ප්‍රකාශනයක්, හිට්ලර් විසින් සම්පාදනය කරන ලදී. පහල මධ්‍යම පන්තියෙන් උපන් හෙතෙම තමාගේ චරිතය හැඩ ගැසූ මුල් අවුරුදු වියනාවේ ගත කලේ ය. ඔහුගේ ලෝක දෘෂ්ටිය ලාභ දක්ෂිනාංශික කුනු අගල් පුවත් පත් විසින් හැඩ ගසනු ලැබිනි. කම්කරු පන්තිය ද සමාජවාදය ද කෙරේ තම වෛරය ඔහු අත් කර ගත්තේ ද එහි දී ය. කොන්ඩේ හෙයිඩන් නැමති ෆැසිස්ට්-විරෝධී තීක්ෂන ජර්මානු ලේඛකයාට අනුව හිට්ලර්ගේ යුදෙව්-විරෝධය, කම්කරු පන්තිය කෙරේ හිට්ලර් දැක් වූ දර්ව භක්ෂක වෛරයේ අතුරු ඵලයක් විය.

හිට්ලර්, "ශක්තිය නිෂ්පාදනය කරා නිත්‍ය ලෙස පරිවර්තනය කිරීමට කැප වූ මානව පැවැත්මේ සමස්ථ ක්ෂේත්‍රයටම වෛර කලේ ය; නිෂ්පාදන සන්තතිය තුලට හසුව ඒ තුල දී තලා දැමීමට ඉඩ දුන්නා වූ මිනිසුන්ට ඔහු වෛර කලේ ය. ඔහුගේ මුලු ජීවිතය පුරාම ඔහුට කම්කරුවන් පෙනී ගියේ භීතියේ සන්කේත රූපයක්, කාලකන්නි පිලිකුල් සහගත කයක් ලෙස ය....... කර්ික වේදිකාවේ සිටගෙන දෑතේ වැඩ කරන්නන්ට චාටු වශයෙන් ඔහු පසු කලෙක කී සෑම දෙයක් ම තනිකර බොරුම විය."

හිට්ලර් යුදෙව්වන් කෙරේ දැක්වූ රකුසු ග්‍රස්තිය වටහා ගත හැකි යතුර ඇත්තේ මෙතැන ය. මයින් කාම්ෆ් [Mein kampf- මගේ හටන] නම් සිය කෘතියේ දී හෙතෙම තමා යුදෙව් විරෝධය කරා පරිවර්තනය වූයේ කම්කරු ව්‍යාපාරය සමග ගැටීම තුලින් යයි හිට්ලර් පැහැදිලි කලේ ය. ඔහුට ප්‍රථමයෙන් ම යුදෙව්වන් හමු වූයේ කම්කරුවන් අතරදී ය. බොහෝ යුදෙව්වන් කම්කරු ව්‍යාපාරය තුල ප්‍රමුඛ ක්‍රියාකලාපයක් ඉටුකල බව ඉක්බිත්තෙන් දැනගත් කල හෙතෙම විශ්මයට පත්

විය. "ඔහුට ආලෝකය උපනැ"යි හෙයිඩන් ලිවී ය. " හදිසියේ ම 'යුදෙව් ප්‍රශ්නය' පැහැදිලි විය....... කම්කරු ව්‍යාපාරය ඔහුට එපා වූයේ එය යුදෙව්වන් විසින් මෙහෙයවනු ලැබූ නිසා නොවේ; ඔහුට යුදෙව්වන් එපා වූයේ ඔවුන් කම්කරු ව්‍යාපාරය මෙහෙය වූ හෙයිනි."

එක් දෙයක් සහතික යයි හෙයිඩ්න් නිගමනය කලේ යඃ "ඇඩොල්ෆ් හිට්ලර්ගේ යුදෙව් විරෝධය මොලවාලූයේ ධනපති රොත්ස්චයිල්ඩ් නොව සමාජවාදී කාල් මාක්ස් විසිනි."

හෙයිඩ්න් ලියු හිට්ලර්ගේ ජීවන චරිතය කියවීම මගින් මහාචාර්ය ගෝල්ඩ්හාගන්ට බුද්ධිමය වශයෙන් වාසියක් ලබා ගැනීමට තිබුනි. නමුත්, ඔහු එසේ කලේ නම්, ඔහු ලිවීමට ඉඩ තිබුනේ මුලුමනින් ම වෙනස් කෘතියකි. එමගින් ඔහුට *හිට්ලර්ගේ ආසක්ත අලුගෝසුවෝ* යන කෘතියෙන් ඔහු ලැබූ තරම් මුදල් කන්දරාවක් නොලැබී යන්නට ඉඩ තිබුනි. ජීවිතයේ දී අප සියලු දෙනා ම දෙකින් එක තෝරා ගන්නෙමු.

## ජර්මන් කම්කරු ව්‍යාපාරයේ අර්බුදය

යුදෙව්-විරෝධය නිසැකයෙන් ම පලමුවන ලෝක යුද්ධයෙන් පසු ජර්මනියේ බලගතු බලවේගයක් විය. එහෙත්, ගෝල්ඩ්හාගන් කුමක් කීවත් යුදෙව්වන් කෙරේ වෛරය පමනක් ම හිට්ලර් බලයට පත් වීම සඳහා දේශපාලන පදනම සම්පාදන කිරීමට අසමත් විය. නාසීන් බලයට පත් වූයේ යුදෙව් විරෝධයේ අනිවාරනීය රැල්ලක් මත නැගී ගෙන නොවේ. නාසි පක්ෂයේ සමාජ පදනම් පිලිබඳ සුපරීක්ෂ අධ්‍යනයෙන් යුදෙව්-විරෝධී ආයාචක බලය 1933 ට පෙර සීමා සහිතව තිබුනු බව තහවුරු කර ඇත්තාහ. සත්තකින් ම නාසීන්ට දැක ගත හැකි වූ කරුනක් නම් යුදෙව් විරෝධය, සමහර පලාත්වල ඔවුන්ට තිබූ බලය අඩුකර දැමූ බවය. එම ප්‍රදේශවල නායකයන්ට යුදෙව් විරෝධී වෛරය වැමැරීම සීමා කරන ලෙසත්, ඔවුන්ගේ කථාවලින් සියලු යුදෙව් විරෝධී සැඳහුම් විරේක කර දමන ලෙසත්, නියම කරන ලදී.

කෙසේ වෙතත්, 1933 දී ජර්මනියේ පැවැති යුදෙව් විරෝධයේ ප්‍රමානය මැනීම නාසීන්ගේ ජයග්‍රහනයේ අර්ථය පැහැදිලි කරනු නැත. යුදෙව්-විරෝධයේ පැවැත්ම කෙතරම් පිලිකුල් දනවන්නේ වුව, එය එක් සාධකයක් පමනක් විය. එය කිසිසේත් ම ජර්මනියේ දේශපාලන ජීවිතයේ ප්‍රධානතම සාධකය නොවී ය. දකුනේ හෝ වමේ දේශපාලන තන්ත්‍රයක් හුදෙක් ජනකායගේ සියලු අගතීන්ගේ සමස්ත ඓක්‍යය නොවේ. එය අවසාන විග්‍රහයේ දී සමාජයේ ප්‍රධාන පන්තීන් අතර දේශපාලන අරගලයේ දී තැලී නිමවුනු කිසියම් සම්බන්ධතාවක ප්‍රකාශනය ය. මෙම අරගලයන්ගේ ප්‍රතිඵලය තුල, නිමග්න පන්තීන්ගේ දේශපාලන නායකත්වයේ ස්වභාවය ද ඔවුන් තම අරගලය පදනම් කර ගන්නා ක්‍රියාමාර්ගය ද දැවැන්ත අර්ථභාරයක් උසුලයි.

දෙන ලද ඕනෑම රටක නිශ්චිත යුදෙව්-විරෝධ ප්‍රමානය මැන ප්‍රමාන කිරීමට හැකි නම් මෙම ප්‍රමානය 1933 ජර්මනියට නො අඩුව 1917 රුසියාවේ ද පැවතුන බව තහවුරු කරලීමට හොඳටම ඉඩ තිබේ. එහෙත් බෝල්ෂෙවික්වරුන්ගේ දේශපාලන තීරනාත්මක භාවය ද පැහැදිලිකම ද, නාගරික හා ගම්බද සුලු ධනේෂ්වරය තුල, එනම් යුදෙව්වන් කෙරේ එතරම් අනුකම්පාවක් නොදැක් වූ කොටස් අතර, තම අධිකාරිය පිහිටුවා ගැනීමේ හැකියාව කම්කරු පන්තියට ලබා දීමෙහි ලා තීරනාත්මක ක්‍රියාකලාපයක් ඉටු කලේ ය.

1917 රුසියාවේ දේශපාලන අරගල සමාප්ත වූයේ ෆැසිස්ටවාදීන්ගේ ජයග්‍රහනයෙන් නොවේ, සමාජවාදීන්ගේ ජයග්‍රහනයෙනි.

ෆැසිස්ට්වාදයේ ජයග්‍රහනය යුදෙව් විරෝධයේ ඍජු හා අනිවාරනීය ප්‍රතිවිපාකය නොව පන්ති අරගලය විසින් සකසන ලද්දා වූ දේශපාලන සන්තතියක ප්‍රතිවිපාකය යි. මෙම සන්තතිය තීරනාත්මක සාධකය වූයේ, ජර්මානු සමාජවාදී ව්‍යාපාරයේ අර්බුදය ය; මෙම අර්බුදය ම ගත් කල ජාත්‍යන්තර සමාජවාදයේ වඩා පුලුල් දේශපාලන අර්බුදයක කොටසකි.

හිට්ලර්ගේ නැගීම නො වැලැක්විය හැකි නුවූවක් මෙන් ම ඔහුගේ ජයග්‍රහනය ද අනිවාරනී ය නොවීය. නාසීන් බලයට පත් වීමට සමත් වූයේ, පලල් සමාජවාදී හා කොමියුනිස්ට්වාදී පක්ෂ, සම්පූර්න පශ්චාත් යුද්ධ කාල පරිච්ඡේදය තුල දී ම දේශපාලන වශයෙන් බංකොලොත් බව ද, ධනවාදය විසින් නිර්මාය කරනු ලැබ ඇති විනාශයෙන් ගොඩ ඒම සඳහා, වික්ෂෝභයට පත් ජනතාවට මවතක් සැපයීමට අසමත් බව ද පෙන්නුම් කලාට පසුව ය.

මෙම දේශනයේ රාමුව තුල ඉදිරිපත් කල හැක්කේ ජර්මානු කම්කරු ව්‍යාපාරයේ අර්බුදය පිලිබඳ ඉතා කෙටි සමාලෝචනයක් පමනි.

1914 දී පලමුවන ලෝක මහා යුද්ධය පුපුරා ගිය කල්හි සමාජ ප්‍රජාතන්ත්‍රය විප්ලවාදී මූලධර්ම අතහැර දමා ජර්මානු ආන්ඩුවේ යුද්ධ වියදම් වලට පක්ෂපාතීව ඡන්දය දී තිබුනේ ය. වසර ගනනාවක් තිස්සේ දිග්ගැසුනු අවස්ථාවාදී පිරිහීමක ප්‍රතිඵලයක් වූ මෙම පාවාදීම, විප්ලවාදී පක්ෂයක් ලෙස සමාජ ප්‍රජාතන්ත්‍ර ව්‍යාපාරයේ අවසානය සලකුනු කලේ ය. එතැන් පටන් සමාජ ප්‍රජාතන්ත්‍රවාදය වඩවඩාත් විවෘතව ධනේෂ්වර පාලනයේ කුලුනක් ලෙසින් ක්‍රියාත්මක විය. 1918-1919 සිද්ධීහු සමාජ ප්‍රජාතාන්ත්‍ර පක්ෂය ධනේෂ්වරයේ කඳවුරට සේන්දු වී තිබුනු බව තහවුරු කලහ.

1918 නොවැම්බර් විප්ලවය විසින් බලයට ගෙන එනු ලැබූ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආන්ඩුව කම්කරු පන්තිය දේශපාලනිකව ද ශාරීරිකවම ද නිරායුධ කිරීමට යෙදී ගත්තේ ය. 1919 ජනවාරියේ දී එය ස්පාටකස් නැගිටීම මර්දනය සංවිධානය කොට රෝසා ලක්සම්බර්ග් හා කාර්ල් ලිබ්නෙක්ට් ඝාතනයට අවසරය දුනි.

බෝල්ශෙවික් විප්ලවය ජයග්‍රහනය ජර්මානු කොමියුනිස්ට් පක්ෂය පිහිටුවීමට දේශපාලන අභිනිවේෂය ලබා දුන්නේ ය. එහෙත් ආරම්භයේ සිට ම එම පක්ෂය දේශපාලන නායකත්ව අර්බූදයකට මුහුන දුනි. එක් අර්ථයකින් ගත් කල එය කවර කලෙකවත් රෝසා ලක්සම්බර්ග් නැති වීමේ පාඩුව ජය ගැනීමට සමත් වූයේ නැත. ඇගේ තැන ගැනීමට සමාන අත්දැකීමෙන් හා දක්‍ෂතාවයෙන් යුතු නායකයෙක් සිටියේ නැත. විප්ලවවාදී දේශපාලන නායකත්වය වර්ධනය කිරීම, බෝල්ෂෙවික් පක්ෂයේ අත්දැකීම විසින් පෙන්වා දී තිබුනු පරිදි මාස නොව අවුරුදු ගනනාවක් අවශ්‍ය වූ දිග්ගැසුනු හා දුෂ්කර සන්තතියකි.

මේ නිසා, ප්‍රංශයින් විසින් රූර් ප්‍රදේශය අත්පත් කර ගැනීම සමග පුපුරා ගිය විප්ලවාදී දේශපාලන තත්වයට මුහුන දීමට ජර්මානු කොමියුනිස්ට් පක්ෂය කිසිසේත් සමත් වූයේ නැත. පුපුරා ගිය අති උද්ධමනය මධ්‍යම පන්තීන් නට්ටන් කොට සමාජ ප්‍රජාතන්ත්‍ර පක්ෂයේ අධිකාරය බිඳ දමා කොමියුනිස්ට් පක්ෂයට බලගතු සහයෝග රැල්ලක් ලබා දුනි.

එක් දෙයක් - දේශපාලන වශයෙන් මුහුකුරා ගිය තීරනාත්මක නායක්ත්වයක් - හැර සමාජ විප්ලවය සඳහා සියලුම කොන්දේසි ජර්මනියේ දක්නට ලැබුනි. 1923 ඔක්තෝබරයේ දී අර්බූදය මුහුපුරා යත්ම වයිමාර් ආන්ඩුව පෙරලා දැමීමට කොමියුනිස්ට් පක්ෂය විසින් උත්සාහයක් දැරෙනු ඇතැයි පුපුල් ජනයා අපේක්ෂා කලහ. නැගිටීමක් සඳහා සකස් කරන ලද තීන්දු කොමියුනිස්ට් පක්ෂයේ බායාදු, අස්ථිර නායකත්වය විසින් අන්තිම මොහොතේ අවලංගු කරන ලදී. මෙසේ සැලසුම් වෙනස් කරන බව කොමියුනිස්ට්වාදීන්ට දැනගැනීමට නො ලැබුනු හැම්බර්ග් නගරයේ කම්කරුවෝ ඇත්තට ම නැගිටීමක් ආරම්භ කලහ. මෙම හුදකලා පියවර ඉක්මනින් ම මඩින ලදී. තමන් පෙරලා දැමීම වැලැක්විය නොහැකි යයි දින කීපයකට පෙර ඒත්තු ගෙන තිබුනු ධනේෂ්වර ආන්ඩුව යලි දිරිමත් විය. අර්බූදය අවසන් විය. ධනපති පාලනය යලිත් ස්ථායි විය.

ඉක්බිති වර්ෂවල ජර්මානු කොමියුනිස්ට් පක්ෂයේ හැඩගැසීම සෝවියට් සංගමයේ නිලධරයේ වැඩෙන බලපෑම විසින් ද ලියොන් ට්‍රොට්ස්කිගේ නායකත්වය ලද වාම විපක්ෂය පාගා දැමීමෙන් ද සැකසුනි. සෝවියට් සංගමය තුල ස්ටැලින්වාදයේ ජයග්‍රහනය ජර්මානු කොමියුනිස්ට් පක්ෂයට ද කම්කරු පන්තියට ද ඛේදජනක ලෙස බලපෑවේ ය.

1923 කම්කරු පන්තියේ පරාජයෙන් පසු ඇති වූ ස්ථාවරත්වයේ සහ සමෘධියේ කෙටි සමය 1929 වෝල්වීදියේ බිඳ වැටීම සහ ලෝක අවපාතයේ ආරම්භය සමග අවසන් විය. ජර්මානු කර්මාන්ත බිඳ වැටුනි. දශලක්‍ෂ ගනන් ජනයාට රැකියා නැතුව ගියහ. මධ්‍යම පන්තිය නට්ටම් විය. නාසි පක්ෂයට ඉක්මනින් මහජන සහායක් ලබා ගැනීමට හැකි කල තත්වයන් මේවාය.

කම්කරු පන්තියේ දේශපාලන සංවිධානය වූ, සමාජ ප්‍රජාතන්ත්‍ර පක්ෂය ද කොමියුනිස්ට් පක්ෂය ද දශලක්‍ෂ සංඛ්‍යාත කම්කරු අනුගාමිකත්වයක් ඇතිව සිටියහ. ෆැසිස්ට් ප්‍රතිවිප්ලවයේ අන්තරායට මුහුන දී සිටි කම්කරු ව්‍යාපාරයේ ක්ෂනික මූලෝපායික කර්තව්‍යය වූයේ නාසීන්ට විරුද්ධ පොදු අරගලයක් තුල තම බලවේගයන් ඒකාබද්ධ කිරීම ය.

එහෙත් ධනේශ්වර වයිමාර් තන්ත්‍රය ආරක්‍ෂා කිරීමට කැප වූ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී නායකයෝ හිට්ලර්ගේ දුඹුරු කමිසකාරුවන්ගේ ප්‍රහාරයන්ට එරෙහිව පවා ජර්මානු කොමියුනිස්ට් පක්ෂය සමග සියලු දේශපාලන සහක්‍රියාකාරීත්වයට, විරුද්ධ වූහ.

සමාජ ප්‍රජාතන්ත්‍රයේ බාධාකාරී ආස්ථානය නො තකා ම කොමියුනිස්ට් පක්ෂය විසින් කල යුතුව තිබුනේ, පක්‍ෂ දෙක අතර දේශපාලන වෙනස්කම් පැවතුනේ වී නමුත් නාසීන්ට එරෙහිව පක්‍ෂ දෙකේ ම ඒකාබද්ධ ක්‍රියාකාරිත්වයක අවශ්‍යතාව පිලිගන්නා ලෙස සමාජ ප්‍රජාතන්ත්‍ර නායකයන්ට ප්‍රසිද්ධියේ කැඳවුම් කිරීම ය.

එහෙත් ස්ටැලින්ගේ උපදෙස් අනුව ගිය කොමියුනිස්ට් පක්ෂය සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්ට සහ ෆැසිස්ට්වාදීන්ට වාසි සලසා දුන් දේශපාලන පිලිවෙතක් අනුගමනය කලේ ය. 1928 දී ට්‍රොට්ස්කි සහ වාම විපක්ෂය කොමියුනිස්ට් ජාත්‍යන්තරයෙන් පලවා හැරීමෙන් එක් වර්ෂයකට පසුව, ස්ටැලින්වාදීහු තීරනාත්මක විප්ලවවාදී අරගල දැන් එලඹ ඇතැයි දැන් ප්‍රකාශ කරමින් ඊනියා තුන්වන කාලපරිච්ඡේදය නිවේදනය කලහ.

මෙම පිලිවෙත බොහෝ දුරට යෝජනා කරන ලද්දේ සෝවියට් සංගමය තුල සාමූහිකකරනයට අනුපූරකව ද එය යුක්ති සහගත කිරීම සඳහා ද විය. ප්‍රායෝගික ක්‍රියාත්මක බව සලකා බලන කල තුන්වන කාලපරිච්ඡේදය සමන්විත වූයේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ වලිගා නට්ටකට නො වැඩි දෙයක් යයි හෙලා දැකීමෙනි. මේ අනුව, ජර්මනියේ ස්ටැලින්වාදීන් අවධාරනය කලේ, සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය සමග එක්සත් පෙරමුනක් ඇති කිරීමට ඉඩදිය නො හැකි යයි ද, එම පක්ෂය ෆැසිස්ට්වාදයේ වාමාංශයක් පමනක් යයි ද ය. සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්ට

"සමාජ ෆැසිස්ට්වාදීන්" යැයි නම් කරන ලදී.

මෙම සාපරාධී වගකීම් රහිත මුලුමනින්ම පාහේ උමතු පිලිවෙතේ විපාකය වූයේ යෝධ සමාවාදී කම්කරු ව්‍යාපාරය විසින් ෆැසිස්ට්වාදයට එරෙහිව ඒකාබද්ධ අරගලයක් කිරීමේ හැකියාව මුලුමනින්ම වලකාලීමය.

1933 ජනවාරියේ දී හිට්ලර් ජර්මනියේ චාන්සලර් (රාජ්‍ය නායක) ධුරයට පත් කිරීමට පෙරාතු දේශපාලන සිද්ධීන් පිලිබඳ තමාගේ ඉතා කෙටි සමාලෝචනයේ දී ගෝල්ඩ්හාගන්, 1932 ජුලි මැතිවරනයෙන් නාසීන්ට ඡන්ද 14 මිලියනයක් එනම් ඡන්දදායකයින්ගෙන් 37.4% ක් ලැබුන බව සඳහන් කරයි. මෙම සංඛ්‍යාව අවධාරනය කෙරෙන පරිදි කලු අකුරින් දක්වා ඇත්තේ නාසි පාක්ෂික හැඟීම් ඉහවහා ගිය තරම හුවා දැක්වීමට ය.

එහෙත් ගොලඩ්හාගන් සමාජ ප්‍රජාතන්ත්‍ර පක්ෂයට හෝ කොමියුනිස්ට් පක්ෂයට ලැබුන ඡන්ද ගැන සඳහන් නො කරයි. ඇත්තට ම සමාජ ප්‍රජාතන්ත්‍ර පක්ෂයට ඡන්ද මිලියන 7.95 ක් (21.6%) ද කොමියුනිස්ට් පක්ෂයට මිලියන 5.2 ක් (14.6%) ද ලැබී තිබුනි. ඒ අනුව ජර්මනියේ සමාජවාදී පක්ෂ දෙකට ඡන්ද මිලියන 13.2 ක් (36.2%) ලැබී තිබුනි. වෙනත් වචනවලින් කියතොත්, ජර්මනියේ දේශපාලන ජීවිතය සමාජවාදී විප්ලවය ද ෆැසිස්ට් ප්‍රතිවිප්ලවය ද අතර ධ්‍රැවාන්ත ගත වී පැවතුනි.

ගෝල්ඩ්හාගන් සඳහන් නො කරන 1932 නොවැම්බර් මස පවත්වන ලද ඊ ලඟ මැතිවරනයේ දී නාසීන්ගේ ඡන්දය නාටකීය ව විසි ලක්ෂයකින් පහතට වැටුනි. ඔවුන් ලත් සම්පූර්න ඡන්ද ප්‍රමානය වූයේ මිලියන 11.73 (33.1%) කි. සමාජ ප්‍රජාතන්ත්‍ර පක්ෂයේ ඡන්ද මිලියන 7.2 (20.4%) දක්වා වැටුනි. කොමියුනිස්ට් පක්ෂයේ ඡන්ද සංඛ්‍යාව මිලියන 5.98 (16.9%) දක්වා ඉහල නැගුනි. සමාජවාදී පක්ෂ දෙකේ ඒකාබද්ධ ඡන්දය දැන් ෆැසිස්ට් ඡන්දයට වඩා පන් ලක්ෂයකින් (අඩ මිලියනයකින්) වැඩි විය. ප්‍රතිශත අනුව ගත හොත්, සමාජ ප්‍රජාතන්ත්‍ර-කොමියුනිස්ට් පක්ෂවල ඒකාබද්ධ ඡන්ද ප්‍රමානය 37.3% කි.

මෙම මැතිවරනය නාසීන්ට අසීමිත දේශපාලන විනාශයක් විය. නාසීන්ගේ මුදුන් පෙත්ත පැනගොස් තිබුනු බවත්, අවසාන නිවේදනය හා දෙගිඩියාවේ සාවාද්‍ය සංයෝගයක් වූ හිට්ලර්ගේ දේශපාලන උපාය නාසීන්ට ඉමහත් පාඩු අත්කර දුන් බවත් පැහැදිලි විය.

"නොවැම්බර් ඡන්දය හිට්ලර්ට හා ඔහුගේ පක්ෂයට හරහ වැටෙන පහරක් වී ය"යි ප්‍රසිද්ධ ඇමරිකානු ඉතිහාසඥ හෙන්රි ඇස්බි ටර්නර් නාසීන් බලයට නැගීමේ අවසාන පියවර පිලිබඳ මෑත අධ්‍යයනයක ප්‍රකාශ කර සිටී. "කලින් අවුරුදු තුන තුල නො කැඩුනු නාටකීය ජයග්‍රහන මාලාවක් තුලින් ගමන් කල පසු, නාසි ගල්රෝල ඇන හිටියේ ය. නාසීන් ඉක්මනින් බලයට පැමින ජර්මනියේ තත්වයට ඉක්මන් හා තීරනාත්මක විසඳුමක් සපයනු ඇතැයි විශ්වාස කරමින් ඔවුන්ට ඡන්දය දුන් බොහෝ දෙනා චාන්සලර් නනතුර ලබා ගැනීමට හිට්ලර් දැරූ ප්‍රයත්නය අසාර්ථක විමත් සමග බලාපොරොත්තු කඩ වී ඉවතට හැරුනහ."12

හුදෙක් ඡන්ද ප්‍රමානය සලකා බලන විට පවා සමාජවාදී කම්කරු ව්‍යාපරය, හිට්ලර් චාන්සලර් පදවියට පත්වීමට ආසන්නව සිටිය දී වුව ෆැසිස්ට්වාදීන්ට වඩා විශාල සංඛ්‍යාත්මක ශක්තියක් දරා සිටියේ ය. කර්මාන්ත අංශයේ තීරනාත්මක තැන් අත්පත් කර ගත් සමාජ බලවේගයක් හැටියට සමාජවාදී කම්කරු ව්‍යාපාරය විභව වශයෙන් අතිශයින් ම ශක්තිමත් විය. ට්‍රොට්ස්කි 1931 දී පෙන්නුම් කල පරිදි: "ඡන්ද සංඛ්‍යා අනුව බලන කල එක් දහසක් ෆැසිස්ට් ඡන්ද, එක් දහසක් කොමියුනිස්ට් ඡන්ද දරනා භාරයම දරයි. එහෙත් විප්ලවීය අරගලයේ තුලාව තුල එක් මහා කම්හලක කම්කරුවන් දහසක්, සුලු නිලධාරීන්, ලිපිකරුවන්, ඔවුන්ගේ ගැහැනු හා නැන්දම්මලා ඇතුලු ඡන්ද දහසකට වඩා බෙහෙවින් ම බරසාර බලවේගයක් නියෝජනය කරයි. ෆැසිස්ට්වාදීන්ගේ අතිමහත් කොටස නියෝජනය කරන්නේ මිනිස් ධූලි ය."13

එහෙත් කම්කරු පන්තියේ නායකත්වයේ වගකීම් රහිත පරාජකවාදී පිලිවෙත විසින් එම පන්තිය දේශපාලන වශයෙන් නිරායුධ කරන ලදී. හිට්ලර් බලයට පත් වූවත් ප්‍රජාතන්ත්‍ර ව්‍යවස්ථාව හව්හරනක් සපයනු ඇතැයි යන්න පුනර්වාදනය කරමින් සමාජ ප්‍රජාතන්ත්‍රවාදය වයිමාර් සමූහාන්ඩුවේ කුනුවෙන මලසිරුරට එල්බී ගෙන සිටියේ ය. කොමියුනිස්ට් පක්ෂය තම වැඩෙන දිරිසුන් බව ජනවංචක වාචාල ගෝසාවකින් වසා ගෙන සිටියේ ය.

අන්තිම සෙල්ලම 1933 ජනවාරි මස නිම කරන ලදී. කම්කරු පන්ති පක්ෂ දෙක ම ප්‍රතිරෝධය දැක්විය නොහැකි මට්ටමට පක්ෂඝාතව ඇතැයි නිගමනය කරමින් ජර්මානු ධනපති පන්තිය, ව්‍යවස්ථානුකූල මාර්ගයකින් බලය ගත යුතු යයි හිට්ලර්ට ආරාධනා කලේ ය. හිට්ලර් 1933 ජනවාරි 30 දා චාන්සලර් පදවියට පත් විය.

කම්කරු පන්තිය ඉතිහාසයේ අතිමහත් ම පරාජයට මුහන දී තිබුනි. මෙම පරාජය ඊ ලඟට ආ විනාශයට මග පෑදී ය.

**අධෝ සටහන්:**

11. ලියොන් ට්‍රොට්ස්කි, *The Sruggle Against Fascism in Germany* (ජර්මනිය තුල ෆැසිස්ට්වාදයට එරෙහි අරගලය), (නිව් යෝර්ක් පාත්ෆයින්ඩර් ප්‍රෙස්, 1970), 400 පි.

12. හෙන්රි ඒ. ටර්නර්, *Hitlers Thirty Days to Power: January 1933* (බලය කරා හිට්ලර්ගේ තිස් දින ගමනඃ 1933 ජනවාරි), (නිව් යෝර්කිඃ ඇඩිසන්-වෙස්ලි ප්‍රකාශක සමාගම, 1996), 14-15 පි.

13. ලියොන් ට්‍රොට්ස්කි, *Germany 1931-32* (ලන්ඩන්ඃ නිව් පාක් ප්‍රකාශන, 1970) 19 පි.

© www.wsws.org